ඩිජිටල් අධ්‍යාපන හා වෘත්තිය සංවර්ධන මධ්‍යස්ථානය මගින් සංවිධාන කරනු ලබන ව්‍යවහාරික දෙමළ භාෂා ඩිප්ලෝමා පාඨමාලාව, ශ්‍රී ලංකාවේ පවතින සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන රාජ්‍ය භාෂා ත්‍රිත්වය අතුරෙන් දෙමළ භාෂාව කේන්ද්‍ර කර ගනිමින් පවත්වයි. ඒ අනුව දෙවන භාෂාවක් ලෙස දෙමළ භාෂාව අධ්‍යයනය කිරීමේ වරප්‍රසාදය මෙම පාඨමාලාවෙන් අභ්‍යන්තර හා බාහිර ශිෂ්‍යයන්ට හිමි වේ. කාලීන අවශ්‍යතාව මත විශ්වවිද්‍යාලයකින් ශිෂ්‍යයකු ලබාගන්නා උපාධියත් සමග ඔහුට හෝ ඇයට අමතර සුදුසුකමක් ප්‍රදාන කිරීම මෙමගින් සිදු වන අතර එය විද්‍යාර්ථියාට හිමිවන සුවිශේෂ වරප්‍රසාදයක් ලෙස සැලකිය හැකිය. එසේම බාහිර ශිෂ්‍යයකුහට සිය වෘත්තිය අවශ්‍යතා සාක්ෂාත් කරගනු වස් රජයේ විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන උසස් ප්‍රමිතියෙන් යුක්ත මෙබඳු ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරීමටද මෙමගින් අවකාශ සැලසේ.
බහුවාර්ගික රටක ජීවත් වන පුද්ගලයන් ලෙස අනෙක් ජාතීන් සමග අන්‍යෝන්‍ය සබඳතා වර්ධනය කිරීමට හා පුද්ගල සහජීවනය ඇති කිරීමට භාෂාත්මක සන්නිවේදනය ඉතා වැදගත් වේ. පුද්ගලයකු ස්වකීය භාෂක සමාජය සමග සන්නිවේදන කටයුතු සඳහා මව් භාෂාව දැන සිටීමත්, වෙනත් ජන කොට්ඨාස හා සම්බන්ධව කටයුතු කිරීම සඳහා දෙවන භාෂාවක් හෝ භාෂා කිහිපයක් දැන සිටීමත්, ලෝකය සමග කටයුතු කිරීමේදී ජාත්‍යන්තර භාෂාව දැන සිටීමත් අත්‍යවශ්‍ය ය. ඒ අනුව මෙකී පාඨමාලාව ආශ්‍රයෙන් ශිෂ්‍යයකුහට තිබිය යුතු දෙවන භාෂාවක් දැන සිටීමේ අවශ්‍යතාව සපුරාලීමට අදහස් කෙරේ.

## පාඨමාලා ඉගෙනුම් ඵල

- ✔ දෙමළ භාෂාව හා ව්‍යාකරණය සම්බන්ධයෙන් පාඨමාලාවෙන් ලබා දුන් දැනුම හා අවබෝධය පිළිබඳ ස්මරණ ශක්‍යතාවක් ඇති කිරීමට හැකිවීම සහ ඒවායේ ස්වයං භාවිතය ප්‍රකරණ විචාරයෙහිලා උපයෝගි කොට ගැනීම, අවස්ථා අර්ථකථනයට මග පෑදීම හා භාෂා සම්ප්‍රවේශනයට පෙළඹවීම.
- ✔ ප්‍රායෝගික ලේඛන කුශලතා වර්ධනය කිරීමට පෙළඹවීමෙන් පැහැදිලි හා නිරවුල් අදහස් ප්‍රකාශනය සහිත ලේඛනකරණය සඳහා ප්‍රවේශ කිරීමේ, පුද්ගලාන්තර සන්නිවේදන සබඳතා ඇති කර ගැනීම සඳහා යොමු කිරීමේ, සමාජ සම්බන්ධතා අන්තර් ග්‍රහණය කොට ගනිමින් පෞද්ගලිකව හා ප්‍රායෝගිකව භාවිත කිරීමේ බුද්ධිමය ශක්‍යතාව මගින් සමාජ වගකීම දියුණු කර ගැනීම.
- ✔ සාහිත්‍යික, භාෂාත්මක හා සංස්කෘතික ශාස්ත්‍රීය සංකථන මගින් ලබා ගත් විචාරාත්මක, නිර්මාණාත්මක කුශලතා පදනම් කොට ගෙන සංස්කෘතික විවිධාංගීකරණයෙන් යුත් සමාජ සන්දර්භ පිළිබඳව සුනම්‍ය වූ දෘෂ්ටියක් ඇති කර ගැනීමෙන් මනා වූ ජීවන දැක්මකින් යුතුවූ වෘත්තිය සාපල්‍යයන් සපුරාගත හැකිවීම.
- ✔ ස්වීකරණය මගින් ලබා ගත් භාෂාත්මක සුවිශේෂතා පිළිබඳ අවබෝධය, භාෂා දැනුම සහ ප්‍රායෝගික පුහුණුව යාවත්කාලීන කර ගැනීමට, නව දැනුම් ක්ෂේත්‍ර පිළිබඳ ගවේෂණය කිරීමට හා පුද්ගල සුභදත්වය වර්ධනය කිරීමට යොදාගත හැකිවීම.

## මෙම පාඨමාලාව හැදෑරිය යුත්තේ ඇයි?

ව්‍යවහාරික දෙමළ භාෂා ඩිප්ලෝමා පාඨමාලාව මගින් ඩිප්ලෝමාධාරියාට දෙමළ අක්ෂර භාවිතය හා ව්‍යාකරණ අවබෝධය, සාහිත්‍යාවබෝධය, දෙමළ සංස්කෘතිය පිළිබඳ දැනීම, කෘති පරිශීලන හැකියාව, පරිවර්තනය හා පරිවර්තන ක්‍රම පිළිබඳ අවබෝධය, ප්‍රායෝගික ලේඛන හැකියාව හා කථන හැකියාව යනාදි ක්ෂේත්‍ර පිළිබඳ දැනුම ලබා දෙනු ලැබේ.

## කා සඳහාද?

ඔබ,
■ දෙමළ භාෂාධ්‍යයනය සඳහා කැමැත්තක් දක්වන්නේ ද?
■ රාජ්‍ය සේවය සඳහා වන දෙමළ භාෂා අවශ්‍යතාව සපුරා ගැනීමේ අභිලාෂයෙන් පසුවන්නේ ද?
■ තමන් ජීවත් වන භාෂක සමාජයේ අවශ්‍යතාව මත දෙමළ භාෂාව ඉගෙනීමට බලාපොරොත්තු වන්නේ ද?

ඔබගේ මෙම අපේක්ෂා සඵල කර ගැනීම සඳහා සුදුසු වන්නේ ව්‍යවහාරික දෙමළ භාෂා ඩිප්ලෝමා පාඨමාලාව යි.

## ඉගැන්වීම් ක්‍රමවේදය

ඉරිදා දිනවල පෙරවරු 8.00 සිට පස්වරු 4.30 තෙක් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දී හෝ මාගර්ගත ක්‍රමවේදයෙන් පැවැත් වේ. මාගර්ගත දේශන, ඩිජිටල් අධ්‍යාපන හා වෘත්තිය සංවර්ධන මධ්‍යස්ථානයේ ඉගෙනුම් කළමනාකරණ පද්ධතියෙන් (LMS) හා ZOOM මෘදුකාංගය ඔස්සේ පවත්වනු ලැබේ. පාඨමාලාව සඳහා තේරී පත් වන සිසුන්හට ඉගෙනුම් කළමනාකරණ පද්ධතියට (LMS) සම්බන්ධ වී අධ්‍යයන කටයුතු සිදු කළ හැකි ය.

## ප්‍රවේශය සඳහා අවශ්‍ය සුදුසුකම්

**අභ්‍යන්තර ශිෂ්‍යයන් සඳහා**
මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයෙහි සාමාන්‍ය හෝ විශේෂ උපාධි හදාරන තෙවැනි වසර ශිෂ්‍යයකු වීම.

**බාහිර ශිෂ්‍යයන් සඳහා**
අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය ඕනෑම විෂය ධාරාවකින් විෂයයන් තුනක් සඳහා අවම වශයෙන් එක් වරකදී සාමාන්‍ය සාමර්ථ්‍යය තුනක් සහිතව සමත්වීම
හෝ
අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය ඕනෑම විෂය ධාරාවකින් විෂයයන් දෙකක් සඳහා අවම වශයෙන් එක් වරකදී සාමාන්‍ය සාමර්ථ්‍යය දෙකක් සහිතව සමත්වීම සහ පිළිගත් ආයතනයක වසරක වෘත්තියමය පළපුරුද්දෙන් යුතු වීම (විශ්වවිද්‍යාලයීය සනාතන සභාවේ අනුමැතියට යටත් ව පිළිගත් ආයතන පමණක් මෙහිදී සලකා බැලේ.)
හෝ
ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ) සිවුවැනි ස්තරය සහිත පදනම් පාඨමාලාවක් සම්පූර්ණ කර සිටීම. (විශ්වවිද්‍යාලයීය සනාතන සභාවේ අනුමැතියට යටත් වූ පදනම් පාඨමාලා පමණක් මෙහිදී සලකා බැලේ.)
හෝ
අවම වශයෙන් වසර 12ක පාසල් අධ්‍යාපනය සම්පූර්ණ කර යෝග්‍යතා පරීක්ෂණයක් සමත් වී තිබීම හා ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ (SLQF) දෙවැනි ස්තරය සහිත පදනම් පාඨමාලාවක් සම්පූර්ණ කර සිටීම.

## තෝරාගැනීමේ පටිපාටිය

- **අභ්‍යන්තර ශිෂ්‍යයන් සඳහා : ලියාපදිංචි වන සියලුම සිසුන් පාඨමාලාවට බඳවා ගැනීම හෝ මාසයක පූර්ව අධ්‍යයන වාරයක් පැවැත්වීමෙන් අනතුරුව එහිදී ලබාගත් දැනුම පදනම් කොට ගනිමින් පවත්වනු ලබන කඩ ඉම් පරීක්ෂණයෙන් තෝරාගන්නා සිසුන්ට පමණක් ව්‍යවහාරික දෙමළ භාෂා ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමේ අවස්ථාව ලබා දීම. (මෙය තීරණය වන්නේ අවස්ථානුකූලවය.)**
- **බාහිර ශිෂ්‍යයන් සඳහා: ලියාපදිංචි වූ සුදුසුකම් සහිත ශිෂ්‍ය ධාරිතාව අපේක්ෂිත මට්ටම ඉක්මවන අවස්ථාවල දී පමණක් කඩ ඉම් පරීක්ෂණයක් පවත්වා පාඨමාලාව සඳහා සිසුන් තෝරා ගනු ලැබේ.**

## පාඨමාලා ගාස්තු

- අභ්‍යන්තර ශිෂ්‍යයන් සඳහා - රු. 35,000.00 (පළමු වාරිකය පාඨමාලා ආරම්භයේ දී ගෙවිය යුතුය)
- බාහිර ශිෂ්‍යයන් සඳහා - රු. 70,000.00 (පළමු වාරිකය පාඨමාලා ආරම්භයේ දී ගෙවිය යුතුය)